

# සංක්‍රමණිකයකුගේ සටහන



### ශිෂ්‍ය වීර දිනය ජුනි 20

සැබෑ ලෙසම සැමරිය යුතු වීරයන් නම් කොපමණ ප්‍රමාණයක් ලංකා භූමිය තුළ වැලලී ගොස් ඇද්ද? ජාතික වීරයන් කියූ සැනින් අපේ මතකයට එන්නේ කැප්පෙටිපොල, පුරන්අප්පු, විල්බාවේ ඇරුණු කොට සේනානායකලා, බණ්ඩාරනායකලා, අරුනාචලම්, ජයතිලකලා, ගුණසිංහලා ගැන පමණයි. ඒ අප හුරු කරවා ඇති අන්දමයි. ඒත් මෑත යුගයේ අප සහ අපේ ඥාතී හිතවතුන් දැරූ දැරියන් භුක්ති විඳින සියලුම අයිතීන් වෙනුවෙන් අරගල කල දිවිදුන් විරුවන් ගැන කථා කරන්නේ කවුද? ජුනි 20 ශිෂ්‍ය වීර දිනය ඔබට එතරම් හුරු පුරුදු නොවන්නේ උවමනාවෙන්ම එය ජනතාවට අමතක කරවන ලද්දක් නිසයි.



මේ දිනය වෙන්වී ඇත්තේ මව්බිමේ ස්වෛරීභාවයත් නිදහස් අධ්‍යාපන අයිතීන් රැක ගැනීම සඳහාත් අරගල කල දිවිපිදු ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ සිසු විරුවන් සැමරීම උදෙසායි. 1984 ජුනි 19 වෙනිදා විරෝධතාවක නියැලී සිටියදී පොලිස් වෙඩි පහරින් මියගිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පද්මසිරි අබේසේකර සිසුවාත්, 1988 ජුනි මස 20 වැනිදා පොලිස් වෙඩි පහරින් මියගිය දික්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ නිශාන්ත ජයවර්ධන සිසුවාත්, පද්මසිරි ඝාතනයට විරෝධතා පා උද්ඝෝෂණය කිරීමේදී පොලිස් වෙඩි පහරින් 1984 ජුනි 21 වෙනිදා මිය ගිය රෝහණ රත්නායක සිසුවාත් ඇතුලු දිවි පුදන ලද සියළුම සිසු විරුවන් මේ සමරු දිනය සංකේතවත් කරනවා. සරදියෙල්, ශූර සරදියෙල් වී ජාතික වීරයෙක් කරන්නට දත කන සමාජයකට සහෝදර ශිෂ්‍ය පරපුරේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් මිය ගිය අය අමතකවීම අරුමයක් නොවේ.

### මැද පිටු දේශපාලනය

මාධ්‍ය දේශපාලනයට කොයිතරම් සමාජයේ විඥානයට බලපෑම් කරන්න පුළුවන්ද යන්න ගැන අප සමාජයේ අය කන බොන, වාද විවාද කරන තැන්වලට කන්දීමෙන් තේරුම් ගන්න පුලුවන්. ඒක ලංකාවට පමණක් නොවේ, මෙල්බර්න් වලටත් පොදුයි. පක්ෂ දේශපාලනයේ මතුපිට සිදුවීම් දෙස බලා නිගමනය, තීන්දු, තීරණවලට ඒම මෝඩකමක්. ඉන් නොනැවතී ඒ කරුණු ඔස්සේ වාද කිරීම ඊටත් හපන් වැඩක්.

සතිඅන්ත පත්‍රවල මැද පිටුවල පලවෙන ජනප්‍රිය දේශපාලන ඕපාදූප තීරු ලිපි යනු හුදෙක් දේශපාලකයන් විසින්ම උන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සාදනු ලබන ජවනිකා පෙලක් පමණයි. විවිධ පක්ෂවල අවශ්‍යතාවයන්ට අනුව තෝරාගත් ලේඛකයෝ ලියනවා. ඔවුනට හොඳට ගෙවනවා. ලිවීමේ සාර්ථකත්වයට අනුව රටේ මිනිස-සු වෙන්නේ මොනවද කියලා දැනගන්න මේව කියවන්න හුරු කරවනවා.

පැදුරු සාජ්ජවල සින්දු කියන ඇමතිලා ගැන, ජනාධිපතිගේ ත්‍යාගශීලී බව, ආරක්ෂක නියෝග නොතකා මල ගෙවල්වල යන හැටි, අගමැති හා තවත් අයෙක් අතර වූ සතර කන් මන්ත්‍රනවල දෙබස් පවා අපට කියවන්න සලස්වන්නේ පරචිත්තවිඥානය ඇති උන් වගේ. මේක දේශපාලකයින් හා මාධ්‍ය එකතු වී කරන ප්‍රෝඩාවක්. යුද්ධය හා පාලම් බෝක්කු ගොඩනැගිලි විවෘත කිරීම්වලට එහා යා හැකි කිසිඳු ජාතික වැඩපිළිවෙලක් නැති රජයක හෙළුව වසා ගන්න කරන අසාර්ථක ප්‍රයත්නයක්. දැන් දශකයක ඉදල අපි අත්දකින දෙයක් මේක.

*<u>මේ නළු වර්ගීකරණයත් මහ විහිළුවක්. පෙම්වතෙක් හෝ චන්ඩියෙක් ලෙස රඟපෑවත්, සිංහයෙක් හෝ හැල ගෙම්බෙක් ලෙස රඟපෑවත් නළුවා නළුවාමයි. රඟපෑ චරිත පෞද්ගලිකත්වයට ඇඳගෙන ජීවිතයම රඟපාන්න ගියහම වෙන්නේ විගඩමක්.</u>*

මිනිස්සු සමාජ දේශපාලන යථාර්ථයන් ගැන තර්කානුකූලව හිතන්න පුරුදුවීම වලක්වන මේ කූඨ වැඩපිළිවෙලට අසුවන්න එපා. සිදුවෙන හැම දෙයක් ගැනම අද සිදුවෙන දේ ඊයේ සිදුවීමත් සමඟ සංසන්දනය කර හිතන්න පුරුදු වෙන්න.

### රන්කෙවිට හා සංවේදී කලාව

කුමන චරිතයක් තිරයේ හෝ වේදිකාවේ නිරූපනය කලද නළු නිළියන් ඇතුළු කලාකරුවන් පිළිබඳ පොදුවේ සමාජය තුළ ඇත්තේ ගෞරවයක් ලෙන්ගතුකමක්. ඒක මේ අර ටෙලිනාට්‍යවල නිතරම කියනවා වගේ ''කලාකරුවෝ කියන්නේ හරි සංවේදී හදවත් තියෙන කට්ටියක් කියලා කියන නිසා නොවෙයි. සමාජයේ හැමෝටම කරන්න බැරි සුවිශේෂී කාර්යයක් ඔවුන් විසින් කරනු ලබන නිසයි. එහෙම වෙන්නේ එතනදී අපට වැදගත් වෙන්නේ ඔහු හෝ ඈ රඟපෑවේ සරත්චන්ද්‍රගේ නාට්‍යයකද, නිහාල් සිල්වාගේ නාට්‍යයකද, නැත්නම් ලෙස්ටර්ගේ චිත්‍රපටයකද, උදයකාන්තගේ එකකද යන්න නොවෙයි. වටින්නේ රඟපෑම පමණයි.

මේ නළු වර්ගීකරණයත් මහ විහිළුවක්. පෙම්වතෙක් හෝ චන්ඩියෙක් ලෙස රඟපෑවත්, සිංහයෙක් හෝ හැල ගෙම්බෙක් ලෙස රඟපෑවත් නළුවා නළුවාමයි. රඟපෑ චරිත පෞද්ගලිකත්වයට ඇඳගෙන ජීවිතයම රඟපාන්න ගියහම වෙන්නේ විගඩමක්. මෙහෙම ලියන්න හිතුනේ පසුගියදා සාර්ථකව තිරගත වුන ''රන් කෙවිට'' නරඹන්න ගිහින් ලබපු අත්දැකීම නිසයි. එහි ප්‍රධාන චරිතයක් රඟපෑ මෙහි වෙසෙන නළුවාට දර්ශනය අවසානයේ ප්‍රේක්ෂක ජනතාව දැක්වූ ප්‍රතිචාරත් එකම කෙෂ්ත්‍රයේ හිටපු, තවත් මෙහි වෙසෙන ප්‍රවීණ කලාකරුවෙක්. දැක්වූ ප්‍රතිචාරයත් දුටු මට නම් ඇති වුණේ දුකක්. ලඟට ඇවිත් වචනයක් කියන්න මොකක්ද වගේ නම්, යන ගමන් දුර ඉදලා හරි මහපට ඇඟිල්ල උස්සල පොඩි දිරිගැන්වීමක්වත් කලා නම්..... එහෙම නේද වෙන්න ඕනේ.

### තිසර

තුන් ස්වරයක අසිරිය. මෙල්බර්න් හි නවතම සිංහල ගුවන් විදුලි මාධ්‍ය සගයා. ''පරණ කට්ටියගේ අළුත් වැඩක්'' තේමා පාඨය මෙන්ම කාර්යයන්ද අසිරිමත් වේ යැයි සිතනවා. ඒත් මේ දේ නම් කිවයුතුමයි. මෙල්බර්න් හි ඇරඹෙන සෑම ගුවන් විදුලි සේවාවකම ශ්‍රවන පරාසය ඉතා කුඩාවීම කනගාටුවට කරුණක්. එය විසිරී සිටින අසන්නන්ට කරන අසාධාරණයක්. මේ ගැන අවධානය යොමු කරන්න.

''හංසයා දියෙන් කිර වෙන්කර ගන්නා සේ'' තිසර ශ්‍රාවකයනට අරුත් සුන් කුණුරොඩු ඉවත් කර හරවත් රසවත් දේ තෝරා බේරා ලබා දේවි යයි ප්‍රාර්ථනා කරනවා.
දිගු ගමනකට ආසිරි...........

### බදාගෙන කෑම හා බෙදාගෙන කෑම

එකම ක්ෂෙත්‍රයේ එකට වැඩ කරන මිනිසුන් ප්‍රසිද්ධියට හා මුදලට එකිනෙකා හා කුළල් කා ගැනීම අපට සුලබ අද්දැකීමක් උනාට මේ වගේ රටකට ඇවිල්ලත් අපේ මිනිස්සු මේ වගේ වැඩ කිරීම ගැන කනගාටුයි. හැකියාවට දක්ෂයාට කොයි තරම් ඉඩක් ඇති රටක් ද මේ. සත්‍යයටත් තවමත් මෙහි වටිනාකමක් ඇති බව සත්‍යයක්. වෙරළු ගෙඩිය හත් දෙනෙක් බෙදාගෙන කාපු රටක එවුන් නේද මේ.. ? තමන් ක්ෂෙත්‍රයේ දක්ෂයෙක් වෙන්න පුලුවන්. ඒත හැම විටම දක්ෂයා මතුවෙන්නේ තරගයත් සමග බව අමතක කිරීම වැරදියි. කෙනෙක් දක්ෂයෙක් බව සමාජය තීරණය කරන්නෙ අනෙකාගේ වැඩ සමග සැසැඳීමෙන_යි. අනෙකා වනසා දමා තමා පමණක් මුදුනා වීමට කෙනෙක් දරන උත්සාහය සමාජය අනුමත නොකරන බව අමතක කරන්න එපා. ෆොටෝ ගැහිල්ලට විතරකන් නෙවෙයි කොයි වෘත්තියටත් මේක පොදුයි. මේ වගේ මිනිස්සු ගැන ඔස්කා වයිල්ඩ් ලියපු කෙටි කතාවක් කලකට පෙර කියෙව්වා මතකයි. ඒ මතකය අලුත් වුණ නිසයි මේක ලිව්වේ. මිත්‍රවරුණි බෙදාගෙන කන්න තියෙන දේ බදාගෙන කන්න හදන්න එපා

## කවි කොළය

අතිගරු දලයි ලාමා මෙරටට වැඩිය
හමුවන්නට බැරිය යයි පැනලම කියපු
වයසක ජොනී ගෙන් ඇහුවම ඇයි කියලා
දුන් උත්තරය දෙයියම්පා අඥෝමය

උණ හෙම්බිරිස්සා හැදිලා සීතලට
අසනීපෙන්ලු මගෙ මිතුරා යූ.එස්.ඒ.
ආවේ නැහැනෙ කිසි උපදේසයක් එහෙන්
ඉන්නේ ගෙහුං එන්නයි තකහනියේම

වෙත්තසිංහ


සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net

සිංහල නවකතා ලෝකයට නව මුහුණුවරක ප්‍රබන්ධයක්...
ළමා මනස වඩවා ගන්නට මාර්ගෝපදේශකයක්...




බ්‍යාමප්‍රභාව
1 සහ 2

ළමයි
හදන්නේ
කොහොම ද?




සූරිය පොත්හලෙන් හා අන්තර්ජාලයේ
www.lankahands.com
වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.
www.dpsdvm.com/AruniShapiro